# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1865/40 – 2014 ජූනි 06 වැනි සිකුරාදා – 2014.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුදෑවල (කොට්ඨාස අංක 2 - මන්දණ්ඩාවල) (මාතලේ මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ජී/එම්ටීඑල්/2013/353 හා 2014.01.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ප්‍රමාණවලින් හා නම්වලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පොල්වත්ත කුඹුර, වරි. අංක 260/1, රත්තොට පාර – ප්‍රමාණය: හෙක්. 0.0461**

උතුරට: කේ. එස්. පෙරේරා හිමිකම් කියන පොල්වත්ත කුඹුර; නැගෙනහිරට: සුදුගඟ; දකුණට: කේ. එස්. පෙරේරා සහ අයි. කේ. පෙරේරා හිමිකම් කියන පොල්වත්ත කුඹුර; බටහිරට: කැබලි අක්ෂර බී සහ කේ. එස්. පෙරේරා හිමිකම් කියන පොල්වත්ත කුඹුර.

02. **කැබලි අක්ෂර 'බී' – පොල්වත්ත කුඹුර, වරි. අංක 260, රත්තොට පාර – ප්‍රමාණය: හෙක්. 0.0043**

උතුරට: අයි. කේ. පෙරේරා සහ කේ. එස්. පෙරේරා හිමිකම් කියන පොල්වත්ත කුඹුර; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ සහ කේ. එස්. පෙරේරා හිමිකම් කියන පොල්වත්ත කුඹුර; දකුණට සහ බටහිරට: අයි. කේ. පෙරේරා හිමිකම් කියන පොල්වත්ත කුඹුර.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2013/එච්ඩබ්ලිව්/444.
2014 ජූනි මස 04 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

06 - 621

1A – G 19681 – 23 (2014/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙලිගල් කෝරළේ සුළු කොට්ඨාසයේ තෝලංගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේජ්/ඩබ්ආර්කේ/2011/234 හා 2012.05.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0052 ක් පමණ වන පහත සඳහන් ප්‍රමාණවලින් හා නම්වලින් යුතු ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – සියඹලාගහමුල වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0023ක් පමණ**

උතුරට: මාර්ග (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: මාර්ගය; දකුණට සහ බටහිරට: සියඹලාගහමුලවත්ත.

02. **කැබලි අක්ෂර 'බී'– සියඹලාගහමුල වත්ත හෙවත් මැදවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0029ක් පමණ**

උතුරට: මාර්ග (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: සියඹලාගහවත්ත හෙවත් මැදවත්ත; දකුණට: සියඹලාගහමුලවත්ත; බටහිරට: මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2011/පීසී/90.
2014 ජනවාරි මස 06 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 622

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.